දුරකථන
தொலைபேசி
Telephones } 011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary } 011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax } 011-2876169
011-2876181

විද්‍යුත් තැපෑල
மின் - அஞ்சல்
E - mail } info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website } www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය
எனது இல.
My No. } PSC/EST/3/1/13/5/2013

ඔබේ අංකය
உமது இல.
Your No. } 7/A/07/01/16/2021

දිනය
திகதி
Date } 2023.03. 08

අධ්‍යක්ෂ (...) 17 MAR 2023 සෞඛ්‍ය ... කොළඹ

SECRETARY MINISTRY OF ... 13 MAR 2023 DDG(A)I 1419963

... 15 MAR 2023 B(A)vii

ලේකම්

සෞඛ්‍ය අමාත්‍යාංශය

**<u>සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් අධීක්ෂණ කළමනාකරණ සහකාර / තාක්ෂණික නොවන/තාක්ෂණික සේවය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය (MN- 03 2006 A) සංශෝධනය කිරීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ සමාංක හා 2022.11.25 දිනැති ලිපිය හා බැඳේ.

02. එම ලිපිය මඟින් ඉදිරිපත් කර ඇති කරුණු සලකා බැලූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව 2014.02.18 දින එම කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවට අයත් අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන/ තාක්ෂණික සේවා ගණයේ (MN 03 – 2006 A) තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය සඳහා මෙම ඇමුණුමෙහි සඳහන් සංශෝධන ඇතුළත් කිරීමට 2023.03.01 දිනැතිව අනුමැතිය ලබා දී ඇති බව එම කොමිෂන් සභාවේ තීරණය පරිදි කාරුණිකව දන්වා සිටිමි. (ඇමුණුම 01 - පිටු 11 කින් යුක්තය.)

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ සංශෝධනයන් බඳවා ගැනීමේ පරිපාටියෙහි සටහන් කර තබන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

ඩී.ඩබ්. ගයාන්

ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ

ලේකම් වෙනුවට

පිටපත්:

1) ලේකම් - ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව

2) ආයතන අධ්‍යක්ෂ ජනරාල්

සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවට අයත් අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික

නොවන / තාක්ෂණික සේවා ගණය (MN-3-2006(ඒ)) තනතුරු සඳහා වන

බඳවා ගැනීමේ පටිපාටිය - සංශෝධන ලැයිස්තුව - 03

| අනු අංකය | වගන්තිය | සංශෝධනය විය යුතු ආකාරය |
|---|---|---|
| 1. | 1.3 | යොමු අංකය DMS/0067/055 දිනය : 2018.08.28<br>යොමු අංකය DMS/0016/043 දිනය : 2018.09.05<br>යොමු අංකය DMS/0016/013 දිනය : 2018.09.25<br>යොමු අංකය DMS/0016/014 දිනය : 2018.09.25<br>යොමු අංකය DMS/0016/111 දිනය : 2018.10.04<br>යොමු අංකය DMS/0016/028 දිනය : 2018.10.11<br>යොමු අංකය DMS/0016/021 දිනය : 2018.10.23<br>යොමු අංකය DMS/0016/097 දිනය : 2018.12.26<br>යොමු අංකය DMS/0016/098 දිනය : 2018.12.26<br>යොමු අංකය DMS/0016/094 දිනය : 2019.01.10<br>යොමු අංකය DMS/0016/103 දිනය : 2019.01.10<br>යොමු අංකය DMS/0016/040 දිනය : 2019.03.09 (මෙම දිනය පැහැදිලි නොමැති බැවින් නිවැරදිව ඇතුළත් කරන්න.<br>යොමු අංකය DMS/0016/002 දිනය : 2019.03.29<br>යොමු අංකය DMS/0016/004 දිනය : 2019.05.27<br>යොමු අංකය DMS/0016/006 දිනය : 2019.05.27<br>යොමු අංකය DMS/0016/128 දිනය : 2022.01.31<br>යොමු අංකය DMS/0016/013 දිනය : 2021.04.08<br>යොමු අංකය DMS/0016/055 දිනය : 2021.04.30<br>යොමු අංකය DMS/0016/026 දිනය : 2021.10.12<br>යොමු අංකය DMS/0016/040 දිනය : 2021.12.15<br>යොමු අංකය DMS/0016/088 දිනය : 2022.03.31<br>යොමු අංකය DMS/0016/122 දිනය : 2022.08.19 |
| 2. | 1.4 | යොමු අංකය EST-2/RECRU/02/0234 දිනය : 2012.02.24<br>දිනය : 2022.10.05 |
| 3. | 1.5 | යොමු අංකය NSCC/4/13/SR-6 දිනය : 2013.01.31<br>යොමු අංකය NPC/4/13/SR-6 දිනය : 2022.05.27 |
| 4. | 02 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් |
| 5. | 3.3 | විද්‍යාත්මක මූලධර්ම මත සංවිධානය වූ ප්‍රායෝගික විෂයයන් හා සම්බන්ධ තාක්ෂණ ඥානය පිළිබඳ පුහුණුව ලබා ගත යුතු බහු කාර්යය ස්වරූපයෙන් යුතුව, සෞඛ්‍ය ආයතන හා රෝහල්වල විධායක කාර්යයන්ට උපස්ථම්භක වන ලෙස විධායකය විසින් පවරනු ලබන මානව, භෞතික, ද්‍රව්‍යමය, තාක්ෂණික දත්ත හා සම්පත් අධීක්ෂණය, මෙහෙයවීම, නඩත්තු කිරීම හා කළමනාකරණය යන කාර්යයන් ද ඇතුළත්ව රෝග නිවාරණය හෝ රෝගී සත්කාරය සඳහා සෘජු හෝ වක්‍ර ලෙස පරිපූරක වන්නා වූ කාර්යයන් ඉටු කරන සේවා ගණයකි. |
| 6. | 05 | වැටුප් :<br><br>5.1 වැටුප් කේත අංක : MN 03 - 2016<br>5.2 වැටුප් පරිමාණය : රු.31,040–10x445–11x660– 10x730–100 x750–57,550/-<br>5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර : |

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය(රු.) |
|---|---|---|
| III | පියවර 01 | රු.31,040 |
| II | පියවර 12 | රු.36,150 |
| I | පියවර 23 | රු.43,480 |

පුහුණු කිරීමේ ශ්‍රේණියට අදාළ දීමනා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන V හි පරිදි වියයුතුය.

7. 06

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනු අංකය | අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|---|
| 1 | මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරී | III, II හා I | 30 | ඇමුණුම 01 |
| 2 | වැඩමූලික(ජීව වෛද්‍ය) | III, II හා I | 50 | |
| 3 | විකලාංග වැඩපල කාර්මික ශිල්පී | III, II හා I | 15 | |
| 4 | විද්‍යුත් නඩත්තු ශිල්පී | III, II හා I | 01 | |
| 5 | සිනමා තාක්ෂණ ශිල්පී | III, II හා I | 02 | |

6.2ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව

| අනු අංකය | අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| 1 | මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරී | 30 |
| 2 | වැඩමූලික (ජීව වෛද්‍ය) | 50 |
| 3 | විකලාංග වැඩපල කාර්මික ශිල්පී | 15 |
| 4 | විද්‍යුත් නඩත්තු ශිල්පී | 01 |
| 5 | සිනමා තාක්ෂණ ශිල්පී | 02 |

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II, I ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකනු ලැබේ.

8. 7.2.1

බඳවා ගන්නා ශ්‍රේණිය :

| අනු අංකය | තනතුර | බඳවා ගන්නා ශ්‍රේණිය |
|---|---|---|
| 01 | මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරී | පුහුණු ශ්‍රේණිය |
| 02 | වැඩමූලික (ජීව වෛද්‍ය) | III ශ්‍රේණිය /පුහුණු ශ්‍රේණිය |
| 03 | විකලාංග වැඩපල කාර්මික ශිල්පී | III ශ්‍රේණිය |
| 04 | විද්‍යුත් නඩත්තු කාර්මික ශිල්පී | III ශ්‍රේණිය |
| 05 | සිනමා තාක්ෂණ ශිල්පී | III ශ්‍රේණිය |

සටහන නොවෙනස්ව පවතී.

<table>
<tr><td>9.</td><td>7.2.2.5</td><td>පහත වගන්තිය ද ඇතුළත් කරන්න.<br>(iv) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙක් මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.</td></tr>
<tr><td>10.</td><td>7.2.4</td><td>"බඳවා ගැනීමේ ක්‍රමය" යටතේ පහත වගන්තිය ඇතුළත් කරන්න.<br>ලිඛිත තරඟ විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවය සමාන සංඛ්‍යාවක්, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.</td></tr>
<tr><td>11.</td><td></td><td>7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය :
<table>
<tr><th>අනු අංකය</th><th>තනතුර</th><th>බඳවා ගන්නා ශ්‍රේණිය</th></tr>
<tr><td>01</td><td>මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරී</td><td>පුහුණු ශ්‍රේණිය</td></tr>
<tr><td>02</td><td>වැඩමුලික(ජීව වෛද්‍ය)</td><td>III ශ්‍රේණිය /පුහුණු ශ්‍රේණිය</td></tr>
<tr><td>03</td><td>විකලාංග වැඩපළ කාර්මික ශිල්පී</td><td>III ශ්‍රේණිය</td></tr>
<tr><td>04</td><td>විද්‍යුත් නඩත්තු කාර්මික ශිල්පී</td><td>III ශ්‍රේණිය</td></tr>
<tr><td>05</td><td>සිනමා තාක්ෂණ ශිල්පී</td><td>III ශ්‍රේණිය</td></tr>
</table>
සටහන නොවෙනස්ව පවතී.</td></tr>
<tr><td>12.</td><td>7.3.2.5</td><td>පහත වගන්ති ඇතුළත් කරන්න.<br>iv. පත්වීම ස්ථිර කර තිබිය යුතුය.<br>v. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 අනුව විනයානුකූල දඬුවම් ලබා නොතිබීම.</td></tr>
<tr><td>13.</td><td>7.3.4</td><td>"බඳවා ගැනීමේ ක්‍රමය" යටතේ පහත වගන්තිය ඇතුළත් කරන්න.<br>ලිඛිත තරඟ විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක්, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.</td></tr>
<tr><td>14.</td><td>7.5</td><td>පහත වගන්ති ඇතුළත් කරන්න.<br>v. කිසියම් තනතුරකට විවෘත හෝ සීමිත ධාරාව යටතේ පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කර ගන්නා අයදුම්කරුවන්ගෙන් පුහුණු කාල සීමාව, අවස්ථානෝචිතව වෙනස් විය යුතු වන්නේ නම්, ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන අදාළ පුහුණු කාල සීමාව සංශෝධනය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.<br>vi. පුහුණු ශ්‍රේණියට අදාළ පුහුණුව, සෞඛ්‍ය ලේකම් විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින් පවත්වනු ලබයි.</td></tr>
<tr><td>15.</td><td>08</td><td>ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය.</td></tr>
<tr><td>16.</td><td>9</td><td>ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය.</td></tr>
<tr><td>17.</td><td>10</td><td>ශ්‍රේණි උසස් කිරීම ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය.</td></tr>
<tr><td>18.</td><td>13</td><td>රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ : අදාළ නොවේ</td></tr>
<tr><td>19.</td><td>17</td><td>අන්තර්කාලීන විධිවිධාන අදාළ නොවේ.</td></tr>
</table>

| | | |
|---|---|---|
| 20. | ඇමුණුම 01 | ඖෂධ සංයෝජක සහ ශ්‍රවණවේදී කාර්මික ශිල්පී තනතුරු මෙම බඳවා ගැනීමේ පටිපාටියෙන් ඉවත් වේ. |
| 21. | ඇමුණුම 02 | වගුවේ සඳහන් ඖෂධ සංයෝජක සහ ශ්‍රවණවේදී කාර්මික ශිල්පී තනතුරු ඉවත් වන අතර අනෙක් තනතුරුවලට අදාළ සුදුසුකම් පහත පරිදි සංශෝධනය වේ. |

| අනු අංකය | තනතුර | සුදුසුකම් |
|---|---|---|
| 02 | මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරී පුහුණු ශ්‍රේණිය (වසර 01) | **පුහුණු ශ්‍රේණිය (වසර 01)**<br><br>01. (අ) අධ්‍යාපන සුදුසුකම් :<br>ජීව විද්‍යාව, රසායන විද්‍යාව,භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය සහ කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් තුනකින් අ.පො.ස.(උ.පෙළ) විභාගය එකවර සමත්ව තිබීම<br>සහ<br>අනෙකුත් සුදුසුකම් නොවෙනස්ව පවතී. |
| 03 | වැඩ මූලික (ජීව වෛද්‍ය) | **III ශ්‍රේණිය**<br>**01 (අ) අධ්‍යාපන සුදුසුකම් :**<br>ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය, සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව විෂයයන් අතුරින් විෂයයන් දෙකක් ඇතුළුව එකවර විෂයයන් තුනකින් අ.පො.ස.(උ.පෙළ) විභාගය සමත්ව තිබීම.<br>සහ<br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් 06 කින් අ.පො.ස(සා.පෙළ) විභාගය සමත්ව තිබීම.<br>සහ<br>ඉහත 1 හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් සහිත පහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලින් එක් සුදුසුකමක් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් විභාග කුසලතා අනුව සුදුසුකම් පරීක්ෂා කර බලා වැඩමූලික (ජීව වෛද්‍ය) III වැනි ශ්‍රේණියට පත්කරනු ලැබේ<br>**(ආ) වෘත්තීය සුදුසුකම්**<br>i. මොරටුව විශ්වවිද්‍යාලය හා අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික (විදුලි / විද්‍යුත්) ඩිප්ලෝමාව<br>ii. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික (විදුලි / විද්‍යුත්) ඩිප්ලෝමාව<br>iii. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු (විදුලි / විද්‍යුත්) ඩිප්ලෝමාව<br>iv. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මඟින් පිරිනමනු ලබන තාක්ෂණික (විදුලි / විද්‍යුත්) ඩිප්ලෝමාව |

v. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කර තිබීම

vi. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා(NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම

vii. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

**පුහුණු ශ්‍රේණිය (වසර 01)**

**(අ) අධ්‍යාපන සුදුසුකම් :**

ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය, සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව විෂයයන් අතුරින් විෂයයන් දෙකක් ඇතුළුව එකවර විෂයයන් තුනකින් අ.පො.ස.(උ.පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් 06 කින් අ.පො.ස(සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

ඉහත 'අ' හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් සහිත පහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලින් එක් සුදුසුකමක් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් විභාග කුසලතා අනුව සුදුසුකම් පරීක්ෂා කර බලා පූර්ණකාලීන අවුරුදු 01ක න්‍යායාත්මක හා සීමාවායික වැඩමූලික (ජීවවෛද්‍ය) පුහුණු පාඨමාලාවට බඳවා ගනු ලැබේ. එලෙස බඳවා ගත් අයදුම්කරුවන් පුහුණුව අවසානයේ පවත්වනු ලබන පරීක්ෂණය සමත්වීමෙන් අනතුරුව වැඩමූලික (ජීව වෛද්‍ය) III වැනි ශ්‍රේණියේ පවත්නා පුරප්පාඩු සඳහා බ ඳවා ගනු ලැබේ.

**(ආ) වෘත්තීය සුදුසුකම්**

i. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්ෂණ සහතිකය ලබා තිබීම .(උදා : ජාතික තාක්ෂණ සහතිකය විදුලි/යාන්ත්‍රික)

ii. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක කර්මාන්ත තාක්ෂණිකයන් සඳහා වූ ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම.

iii. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

සටහන :

i. III වන ශ්‍රේණියට සෘජුව බඳවා ගැනීම සහ පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීම යන ක්‍රම දෙකින්ම බඳවා ගන්නා විට, බඳවා ගැනීමේ ශ්‍රේණිය වන III වන ශ්‍රේණියට පළමුව බඳවා ගත යුතුය.

| | | | | |
|---|---|---|---|---|
| | | | | ii. III වන ශ්‍රේණියට සුදුසුකම් ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට ප්‍රමාණවත් නොවන විට,<br>iii. ඉතිරි පුරප්පාඩු සඳහා පුහුණු ශ්‍රේණියට අදාළ සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කර ගනු ලැබේ. |
| | | 04 | විකලාංග වැඩපල කාර්මික ශිල්පී (III ශ්‍රේණිය) | **(III ශ්‍රේණිය)**<br>**(අ) අධ්‍යාපන සුදුසුකම් :**<br>භෞතික විද්‍යාව ඇතුළු විද්‍යා විෂයයන් 03 කින් අ.පො.ස.(උ.පෙළ) විභාගය එකවර සමත්ව තිබීම<br>සහ<br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් 06 කින් අ.පො.ස (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.<br>සහ<br>ඉහත 'අ' හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් සහිත පහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලින් එක් සුදුසුකමක් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් විභාග කුසලතා අනුව සුදුසුකම් පරීක්ෂා කර බලා විකලාංග වැඩපල කාර්මික ශිල්පී III වැනි ශ්‍රේණියට පත් කරනු ලැබේ.<br>**(ආ) වෘත්තීයසුදුසුකම්**<br>i. මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික (විදුලි / විද්‍යුත්) ඩිප්ලෝමාව<br>ii. ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික (විදුලි / විද්‍යුත්) ඩිප්ලෝමාව<br>iii. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු (විදුලි / විද්‍යුත්) ඩිප්ලෝමා<br>iv. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මඟින් පිරිනමනු ලබන තාක්ෂණික (විදුලි / විද්‍යුත්) ඩිප්ලෝමාව<br>v. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම<br>vi. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා(NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.<br>vii. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවවිසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |
| | | 06 | සිනමා තාක්ෂණ ශිල්පී (III ශ්‍රේණිය) | **III ශ්‍රේණිය**<br>**(අ) අධ්‍යාපන සුදුසුකම් :**<br>ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය, සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව විෂයයන් අතුරින් විෂයයන් දෙකක් ඇතුළුව එකවර විෂයයන් තුනකින් අ.පො.ස.(උ.පෙළ) විභාගය සමත්ව තිබීම.<br>සහ<br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් 06 කින් |

| | | | | |
|---|---|---|---|---|
| | | | | අ.පො.ස(සා.පෙළ) විභාගය සමත්ව තිබීම.<br>සහ<br>ඉහත 'අ' හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් සහිත පහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලින් එක් සුදුසුකමක් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් විභාග කුසලතා අනුව සුදුසුකම් පරීක්ෂා කර බලා සිනමා තාක්ෂණ ශිල්පී III වැනි ශ්‍රේණියට පත් කරනු ලැබේ.<br>**(ආ) වෘත්තීයසුදුසුකම්**<br>i. මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික (විදුලි / විද්‍යුත්) ඩිප්ලෝමාව<br>ii. ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික (විදුලි / විද්‍යුත්) ඩිප්ලෝමාව<br>iii. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු (විදුලි / විද්‍යුත්) ඩිප්ලෝමාව<br>iv. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණික (විදුලි / විද්‍යුත්) ඩිප්ලෝමාව<br>v. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම<br>vi. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ)06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.<br>vii. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |
| | | 07 | විද්‍යුත් නඩත්තු කාර්මික ශිල්පී (III ශ්‍රේණිය) | **(III ශ්‍රේණිය)**<br>**(අ). අධ්‍යාපන සුදුසුකම් :**<br>භෞතික විද්‍යාව ඇතුළු විද්‍යා විෂයයන් 03 කින් අ.පො.ස.(උ.පෙළ) විභාගය එකවර සමත්ව තිබීම<br>සහ<br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් 06 කින් අ.පො.ස(සා.පෙළ) විභාගය සමත්ව තිබීම.<br>සහ<br>ඉහත 'අ' හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් සහිත පහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලින් එක් සුදුසුකමක් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් විභාග කුසලතා අනුව සුදුසුකම් පරීක්ෂා කර බලා විද්‍යුත් නඩත්තු කාර්මික ශිල්පී III වැනි ශ්‍රේණියට පත් කරනු ලැබේ.<br>**(ආ) වෘත්තීය සුදුසුකම්**<br>i. මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික (විදුලි / විද්‍යුත්) ඩිප්ලෝමාව<br>ii. ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික (විදුලි / විද්‍යුත්) ඩිප්ලෝමාව<br>iii. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු |

| | | |
|---|---|---|
| | | ලබන ජාතික උසස් ඉංජිනේරු (විදුලි / විද්‍යුත්) ඩිප්ලෝමාව<br>iv. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මඟින් පිරිනමනු ලබන තාක්ෂණික (විදුලි / විද්‍යුත්) ඩිප්ලෝමාව<br>v. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම.<br>vi. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.<br>vii. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |

ඇමුණුම 03

ඖෂධ සංයෝජක සහ ශ්‍රවණවේදී කාර්මික ශිල්පී තනතුරු මෙම වගුවෙන් ඉවත් වේ.

| අනු අංකය | තනතුර | සුදුසුකම් |
|---|---|---|
| 01 | මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරී | මේ යටතේ දක්වා ඇති සුදුසුකම්වල වෙනසක් සිදු නොවේ. |
| 02 | වැඩමූලික (ජීව වෛද්‍ය) (වසර 01/III ශ්‍රේණිය) | **III ශ්‍රේණිය**<br>**(අ) අධ්‍යාපන සුදුසුකම් :**<br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය යන විෂයයනට සම්මාන සාමාර්ථයක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 කින් අ.පො.ස(සා.පෙළ) විභාගය සමත්ව තිබීම.<br>**(ආ) වෘත්තීය සුදුසුකම්**<br>පහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලින් එක් සුදුසුකමක් සපුරා තිබීම<br>i. මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික (විදුලි / විද්‍යුත්) ඩිප්ලෝමාව<br>ii. ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා (විදුලි / විද්‍යුත්) ජාතික ඩිප්ලෝමාව<br>iii. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු (විදුලි / විද්‍යුත්) ඩිප්ලෝමාව<br>iv. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මඟින් පිරිනමනු ලබන තාක්ෂණික (විදුලි / විද්‍යුත්) ඩිප්ලෝමාව<br>v. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම |

vi. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

vii. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

**(ඇ) පලපුරුද්ද :**

ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක ස්ථිර, දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා පලපුරුද්දක් තිබීම

**පුහුණු ශ්‍රේණිය (වසර 01)**

**(අ)අධ්‍යාපන සුදුසුකම් :**

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය යන විෂයයනට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 කින් අ.පො.ස(සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

**(ආ) වෘත්තීය සුදුසුකම්**

i. තෘතියික හාවෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්ෂණ සහතිකය ලබා දී තිබීම.(උදා : ජාතික තාක්ෂණ සහතිකය විදුලි/යාන්ත්‍රික)

ii. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක කර්මාන්ත තාක්ෂණිකයන් සඳහා වූ ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම.

iii. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

ඉහත සඳහන් එක් වෘත්තීය සුදුසුකමක් සමඟ අදාළ ක්ෂේත්‍රයේ වසර 05 ක පලපුරුද්ද

**(ඇ) පලපුරුද්ද :**

ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක ස්ථිර, දෙපාර්තමේන්තුගත

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10 ක සක්‍රිය හා සතුටුදායක සේවා පලපුරුද්දක් තිබීම. |
| | | | | විකලාංග වැඩපල කාර්මික ශිල්පී (III ශ්‍රේණිය | (අ). අධ්‍යාපන සුදුසුකම් :<br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය යන විෂයයනට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 කින් අ.පො.ස(සා.පෙළ) විභාගය සමත්ව තිබීම.<br>(ආ) වෘත්තීය සුදුසුකම්:<br>පහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලින් එක් සුදුසුකමක් සපුරා තිබීම<br>i. මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික (විදුලි / විද්‍යුත්) ඩිප්ලෝමාව<br>ii. ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික (විදුලි / විද්‍යුත්) ඩිප්ලෝමාව<br>iii. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු (විදුලි / විද්‍යුත්) ඩිප්ලෝමාව<br>iv. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණික(විදුලි / විද්‍යුත්) ඩිප්ලෝමාව<br>v. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම<br>vi. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා(NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.<br>vii. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.<br>(ඇ) පලපුරුද්ද :<br>ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක ස්ථිර, දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා පලපුරුද්දක් තිබීම.<br>පුහුණු ශ්‍රේණිය (වසර 01)<br>(අ)අධ්‍යාපන සුදුසුකම් :<br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය යන විෂයයනට |

| | | | | |
|---|---|---|---|---|
| | | | | සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 කින් අ.පො.ස(සා.පෙළ) විභාගය සමත්ව තිබීම.<br>(ආ) වෘත්තීය සුදුසුකම්:<br>පහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලින් එක් සුදුසුකමක් සපුරා තිබීම<br>i. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්ෂණ සහතිකය ලබා දී තිබීම.(උදා : ජාතික තාක්ෂණ සහතිකය විදුලි/යාන්ත්‍රික)<br>ii. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක කර්මාන්ත තාක්ෂණිකයන් සඳහා වූ ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම.<br>iii. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.<br>(ඇ) පලපුරුද්ද :<br>ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක ස්ථිර, දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10 ක සක්‍රීය හා සතුටුදායක සේවා පලපුරුද්දක් තිබීම. |

දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

1454917

මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/3/1/13/5/2013

ඔබේ අංකය / உமது இல. / Your No.: 7/A/07/01/16/2021

දිනය / திகதி / Date: 2023.07.27

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

අධ්‍යක්ෂ (ආයතන) I
01 7A
04 AUG 2023
සෞඛ්‍ය අමාත්‍යාංශය කොළඹ 10.

D(A)VII
31 JUL 2023
4 DDG(A) I
සෞඛ්‍ය අමාත්‍යාංශය

DDG/A-I
28 JUL 2023
SECRETARY MINISTRY OF HEALTH

ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය

**<u>සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවට අයත් අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන / තාක්ෂණික සේවා ශ්‍රේණිය (MN- 03) තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ සමාංක හා 2023.03.31 දිනැති ලිපිය හා බැඳේ.

02. එම ලිපිය මඟින් ඉදිරිපත් කර ඇති කරුණු සලකා බැලූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව, 2014.02.18 දින එම කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද, ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවට අයත් අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන / තාක්ෂණික සේවා ශ්‍රේණිය (MN-03) තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය සඳහා මෙහි ඇමුණුමෙහි සඳහන් සංශෝධන ද ඇතුළත් කිරීමට 2023.07.21 දිනැතිව අනුමැතිය ලබා දී ඇති බව එම කොමිෂන් සභාවේ තීරණය පරිදි කාරුණිකව දන්වා සිටිමි. (ඇමුණුම පිටු 01 කින් යුක්තය.)

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ සංශෝධනයන් බඳවා ගැනීමේ පරිපාටියෙහි සටහන් කර තබන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

ආර්.එච්.ටී.එස්. හෙට්ටිආරච්චි
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත: ආයතන අධ්‍යක්ෂ ජනරාල් - කරු. දැ.ගැ.ස.

**සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවට අයත් අධීක්ෂණ කළමනාකරණ සහකාර**

**තාක්ෂණික නොවන / තාක්ෂණික සේවා ගණය (MN-3-2006(ඒ) තනතුරු සඳහා වන**

**බඳවා ගැනීමේ පටිපාටිය**

**සංශෝධන ලැයිස්තුව ( සිව්වන සංශෝධනය)**

| අනු අංකය | ඡේද අංකය | සංශෝධනය විය යුතු ආකාරය |
|---|---|---|
| 01 | 1.6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය:<br>මේ යටතේ දැනට ඇතුළත් කර ඇති කරුණුවලට අමතරව පහත කරුණ ද ඇතුළත් කරන්න.<br>සිව්වන සංශෝධනය: 2023.07.21 |
| 02 | ඇමුණුම 02 හි 03<br>වැඩ මූලික (ජීව වෛද්‍ය) | III ශ්‍රේණිය<br>(ආ) වෘත්තීය සුදුසුකම්<br>i. මොරටුව විශ්ව විද්‍යාලය <u>හෝ</u> අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික (විදුලි / විද්‍යුත්) ඩිප්ලෝමාව<br>(අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී) |
| 03 | ඇමුණුම 03 හි 03<br>විකලාංග වැඩපල කාර්මික ශිල්පී (III ශ්‍රේණිය) | පුහුණු ශ්‍රේණිය යටතේ ඇති කරුණු ඉවත් කරන්න. |